# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2386/26 – 2024 මැයි මස 31 වැනි සිකුරාදා – 2024.05.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/02/2023/46.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.12.04 දිනැති හා අංක 2361/04 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.30 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් වාද්දූව, උතුරු තල්පිටිය, මැද පාර, අංක 2/23 හි පදිංචි පී.එච්.කාංචනා ප්‍රියදර්ශනී මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 03, ශාන්ත මයිකල් පාර, නො.18 හි පිහිටි සී.එම්.එල්.එම්.ටී.ඩී. කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A82/2023 හා 2024.03.02 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේදීය

නඩු අංකය A/82/2023
IR/COM/02/2023/46

පී.එච්. කාංචනා ප්‍රියදර්ශනී මිය,
නො. 2/23,
මැද පාර,
උතුරු තල්පිටිය, වාද්දූව.

*පළමු පාර්ශ්වය*

*එරෙහිව*

සී.එම්.එල්.එම්.ටී.ඩී. කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ්,
නො. 18, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

*දෙවන පාර්ශ්වය*

එරෙහිව පවතින ආරාවුල

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කරන ලදී.

පී. එච්. කාංචනා ප්‍රියදර්ශනි මිය හා සී.එම්.එල්.එම්.ටී.ඩී. කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් යන ඉහත සඳහන් පාර්ශ්වයන් අතර, ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

සී.එම්.එල්.එම්.ටී.ඩී. කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් හි සේවය කරන පී.එච්. කාංචනා ප්‍රියදර්ශනී මහත්මිය හට 2020 නොවැම්බර්, දෙසැම්බර්, 2021 මාර්තු, අප්‍රේල් මාසවලට අදාළ ක්ෂේත්‍ර දිරි දීමනාව හිමිද? හිමිනම් එය නොලැබීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහනයන් කවරේද? යන්නත් පිළිබඳ වේ.

මෙම නඩුකරය 2024.01.10 වන දින ප.ව.2.30 ට ගරු බේරුම්කරණ අධිකරණය වෙත කැඳවා තිබුණි. මෙදින දෙවන පාර්ශ්වය හෙවත් වග උත්තරකාර පාර්ශ්වය බේරුම්කරණ අධිකරණය වෙත නීතිඥ සහය සමග පැමිණ සිටින ලදී. කෙසේ වෙතත් පැමිණිලිකාරිය හෙවත් පළමු පාර්ශ්වය මෙදින පැමිණ නැත. ඇයගේ නොපැමිණීම පිළිබඳ යම් ආකාරයකින් හෝ වාර්තා කිරීමක් ද සිදු වී නොතිබුණි.

එබැවින් යළිත් නඩුකරය 2024.03.01 දින ප.ව.3.00 ට කැඳවීමට තීරණය කෙරුණි. මෙදින ද වග උත්තරකාර පාර්ශ්වය බේරුම්කරණ අධිකරණය වෙත පැමිණ සිටි නමුත් පැමිණිලිකාර පාර්ශ්වයේ සහභාගීත්වයක් නොවීය.

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත යටතේ ආරාවුල විභාග කරන බව දැන්වීම යන මැයෙන් සී.එම්.එල්.එම්.ටී.ඩී. ඉදිකිරීම් සමාගමේ ඈවරකරු විසින් 2024 ජනවාරි 09 දිනැතිව පී.කේ. සුදත් කුමාර HC/Civil/32/2019/CO දරන නඩු අංකය යටතේ සී.එම්.එල්.එම්.ටී. ඩී. Constructions Ltd නැමැති සමාගමේ ඈවරකරු වශයෙන් 2022.09.02 දින කොළඹ වාණිජ මහාධිකරණය විසින්

තමා පත් කර ඇති බවත් 2024.01.10 වන දින බේරුම්කරණ අධිකරණයේ පැවැත්වෙන නඩුවට ඔහුගේ නියෝජිතයෙකු සහභාගී වන බවත්, දක්වා තිබුණි. එමෙන්ම ඒ සමගම කොළඹ (සිවිල්) මහාධිකරණය විසින් 2023 මැයි මස 10 වන දින නිකුත් කළ ඇවරකරු පත් කිරීමේ නියෝගයේ පිටපතක් ද එවා තිබුණි. 2024.01.10 වන දින බේරුම්කරණ අධිකරණයේදී දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ සුදත් හෙට්ටිආරච්චි මහතා දන්වා සිටියේ මෙම සමාගම කොළඹ වාණිජ මහාධිකරණයේ 32/2019 CO නඩුව යටතේ ඇවරකරණයට ලක් කරන බවත්, එම නිසා 2007 අංක 07 දරන සමාගම් පනතේ 279 වගන්තිය ප්‍රකාරව මෙම කාර්මික අධිකරණයේ නඩුව පවත්වා ගෙන යාමට ඉහත කොළඹ වාණිජ මහාධිකරණයේ දැක්වූ නඩුවේ 279 වගන්තිය යටතේ අවසරයක් ලබා ගත යුතු බවයි. එසේ අවසර ලබා ගන්නා ලෙස පැමිණිලිකාර පාර්ශ්වයට දැනුම් දෙන ලෙස බේරුම්කරණ අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටී. මේ අනුව උත්ගත වී ඇති තත්වය ප්‍රකාරව තවදුරටත් මෙම බේරුම්කරණ නඩුව පවත්වාගෙන යන්නේද පිළිබඳව තීරණයක් ලබා දීමට කටයුතු කළ යුතු වේ.

මෙම නඩුකරය සඳහා පැමිණිලිකාර පාර්ශ්වය වන පී.එච්. කාංචනා ප්‍රියදර්ශනී මිය සහභාගී නොවීම පිළිබඳ යලි අවධානය යොමු කළ අධිකරණය 2024.02.19 දිනැති ලිපිය මගින් ඇයට පහත සඳහන් දැනුම් දීම් යලි සිදු කර ඇත.

“උක්ත ආරාවුල සඳහා 2024.01.10 දින ඔබ පාර්ශ්වයේ සහභාගීත්වයක් නොමැත. පරීක්ෂණය සඳහා නොපැමිණෙන බව ද දන්වා නැත. ඒ අනුව 2024 මාර්තු මස 01 වන දින ප.ව.3.00 ට තමන් හෝ තමන් වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරුන්/ බලය පවරන ලද නියෝජිතයන් ද සමග අනිවාර්යෙන්ම බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ පෙනී සිටිය යුතු බව දැනුම් දෙනු ලැබේ. ඔබ මෙදිනට ද සහභාගී වීමට අපොහොසත් වුවහොත් පළමු පාර්ශ්වයේ උනන්දුවක් නොමැති සේ සලකා ගොනුව වසා දමන බව වැඩි දුරටත් දන්වා සිටිමි ”

නඩුකරය 2024 මාර්තු මස 01 වන දින කැඳවූ නමුත් පළමු පාර්ශ්වය හෙවත් පැමිණිලිකාරිය හෝ ඇයගේ නියෝජනයක් සිදු නොවීය.

මෙම තත්වයන් මත නඩුකරය තවදුරටත් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවයක් පැන නොනඟී. ගොනුව වසා දැමීමට තීරණය කරමි. නඩුකරය අවසන් කරමි.

ආචාර්ය කේ.ඒ. තිලකරත්න,
(බේරුම්කරු).

2024 මාර්තු මස 02 වන දින.

EOG 05 - 0193

---

*මගේ අංකය*: IR/COM/01/2021/05.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.06.27 දිනැති හා අංක 2338/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2023.06.22 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාතලේ, කොටුවේගෙදර, ජාතික නිවාස සංකීර්ණය, අංක 24 හි පදිංචි යූ.ඒ. ලහිරු රංගන සඳරුවන් මහතා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී.බී. ජයා මාවත, අංක 519 හි පිහිටි MBSL රක්ෂණ සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A48/2023 හා 2023.12.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේදීය

නඩු අංකය A/48/2023
IR/COM/01/2021/05

යූ.ඒ. ලහිරු රංගන සඳරුවන් මයා,
අංක 24,
ජාතික නිවාස සංකීර්ණය,
කොටුවේගෙදර,
මාතලේ.

*පළමු පාර්ශ්වය*

*එරෙහිව*

MBSL රක්ෂණ සමාගම,
අංක 519,
ටී.බී. ජයා මාවත,
කොළඹ 10.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු ලෙස මා පත් කරන ලදී.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ

- 2012.09.21 දින ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක නිලධාරියෙකු ලෙස MBSL රක්ෂණ සමාගමේ සේවයට බඳවාගෙන ඇති යූ.ඒ. ලහිරු රංගන සඳරුවන් මහතාට රැකියාවට බැඳුණු අවස්ථාවේදී පැවති මූලික වැටුප සියලු දීමනා හා නිලය සේවා ගිවිසුම අවලංගු කිරීමක් නොකොට නව ගිවිසුමකට එළැඹීමට පෙර 2015 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක නිලධාරියෙකු සඳහා ලබාදෙන වැටුප, සියලුම දීමනාවන් හා වරප්‍රසාද ලබා නොදීම.
- 2012.09.21 දින සිට සේවය කළ ද, මේ වන තෙක් සේවය ස්ථිර නොකිරීම.

මගින් අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් මොනවාද යන්නත් පිළිබඳ වේ.

මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය 2023.07.11 දින කැඳවන ලද අතර ඊට පළමු පාර්ශ්වය සහභාගි නොවීය. කෙසේ වෙතත් කැඳවීම් ලිපිය තැපෑලෙන් ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් ඔහු වෙනත් දිනයක් ලබාදෙන මෙන් බේරුම්කරණ අංශය වෙතින් දුරකථනයෙන් ඉල්ලුම් කර තිබුණි. දෙවන පාර්ශ්වයේ නියෝජනය පැවතුණි. ඒ ඒ පාර්ශ්වයන්ගේ පළමු විස්තර ප්‍රකාශන 2023.08.10 දිනට ලබාදිය යුතු බවත් නඩුකරය එදිනයට කැඳවීමටත් නියෝග කෙරුණි. මෙම දිනය බේරුම්කරු විසින් 2023.08.21 දින පෙ.ව. 10.00 ලෙස ට සංශෝධනය කරන ලදී. ඒ අනුව එදින බේරුම්කරණ අධිකරණය මෙම නඩු කටයුත්ත

පරීක්ෂණයට භාජනය කරන ලදී. එදින දෙපාර්ශ්වය විසින්ම පළමු විස්තර ප්‍රකාශන හුවමාරු කරගනු ලැබීය. යලිත් පරීක්ෂණය 2023.09.18 දින පෙ.ව. 09.00 ට දින නියම කෙරුණි. එදිනට දෙපාර්ශ්වයම දෙවන විස්තර ප්‍රකාශන ලබාදිය යුතු බවට නියම කෙරුණි. 2023.09.18 දින මෙම නඩුකරය යලි කැඳවන ලද අතර දෙවන විස්තර ප්‍රකාශන එදින දෙපාර්ශ්වය අතර හුවමාරු කරගන්නා ලදී. ඒ අනුව සාක්ෂි විභාගය හා පරීක්ෂණය 2023.10.17 දින යලිත් නඩුකරය කැඳවන ලද අතර මෙදින සාක්ෂි විභාගය ආරම්භ කෙරුණි. මෙදින දෙවන පාර්ශ්වය විසින් සාක්ෂි මෙහෙයවන ලදී. යලි සාක්ෂි විමසීම හා පරීක්ෂණය 2023.10.27 දින පෙ.ව. 10.00 ට නැවත සාක්ෂි විභාගය අවසන් කරන ලදී. මෙදින පසුගිය සාක්ෂි විභාගයේදී දෙවන පාර්ශ්වය විසින් ලබාදුන් R1,R2,R3,R4 හා R5 ලේඛන වලට පළමු පාර්ශ්වය විරෝධතා වාචිකව ප්‍රකාශ කළ අතර එම ලේඛන මෙම නඩුකරයට අයත් ලේඛන බැවින් විරෝධතා ප්‍රතික්ෂේප කරන ලදී. පරීක්ෂණ කටයුතු අවසන් වුවත් තවදුරටත් දෙපාර්ශ්වය සාකච්ඡා කොට කිසියම් එකඟතාවයකට පැමිණීමේ හැකියාව යෝජනා වූ බැවින් ඊට අවස්ථාවක් සලසනු වස් පරීක්ෂණය 2023.08.21 දිනට කල් තබන ලදී.

පළමු පාර්ශ්වය විසින් 2023 අගෝස්තු මස 21 දිනැතිව මෙම පරීක්ෂණය සඳහා ඇමුණුම් අංක 01,02,03,04,05,06,07,08,09, ආදී වශයෙන් දක්වන ලද ලේඛන සමග ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් සිදුකර ඇත. ඔහු රැකියාවට බැඳුනු අවස්ථාවේ පැවති මූලික වැටුප අඩුකර සේවය කළ නිලයෙන් අත්තනෝමතික ලෙස පහල දැමීම හා රැකියාවට බැඳුනු අවස්ථාවේ පැවති මුල් ගිවිසුම උල්ලංඝණය සිදු කිරීමට අදාළ කරුණු ගණනාවක් එම පළමු විස්තර ප්‍රකාශනය තුළින් පැහැදිලි කර ඇත. එමෙන්ම දෙවන පාර්ශ්වය විසින් ගිවිසුම කඩ කිරීම හේතුවෙන් තමාට නොලැබුනු ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක නිලධාරියෙකු වෙනුවෙන් ලබා දෙන වැටුප ගණනය කළ විට තමන් හට අයවිය යුතු මුදල හා අහිමි වු විදේශ සංචාරය වෙනුවෙන් ගණන් බැලූ රු. 7,874,400/= මුදලක් ලැබීමට හිමිකම් ඇති බවත් මෙම මුදලින් 2015 සිට දෙවන පාර්ශ්වය තමා හට ගෙවා ඇති වැටුප් හා දීමනා සියල්ල අඩුකොට ඉතිරි මුදල ලබා ගැනීමේ අවශ්‍යතාවය එම පළමු විස්තර ප්‍රකාශනයේ දක්වා ඇත.

දෙවන පාර්ශ්වය විසින් ද ඇමුණුම් X1 හා X2 සහිත තම පළමු විස්තර ප්‍රකාශනය 2023 අගෝස්තු 10 දිනැතිව බේරුම්කරණ අධිකරණය වෙත ඉදිරිපත් කරන්නට යෙදුනි. පළමු පාර්ශ්වය විසින් මෙම අයදුම්පත ගොනුකරන අවස්ථාවේදී පාර්ශ්වයන් අතර සජීවී ආරාවුලක් නොමැති නිසා බේරුම්කරණ අධිකරණය හමුවේ මෙය පවත්වා ගෙන යා නොහැකි බවට කරුණු ගෙන හැර දක්වා ඇත. එමෙන්ම නියමිත විකුණුම් ඉලක්ක සපුරා නොමැති වීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ විධායක මට්ටම දක්වා තනතුර හා වැටුප පහළ හෙලා ඇති බවට දෙවන පාර්ශ්වය විසින් මෙම විස්තර ප්‍රකාශනය තුළින් පිළිගෙන ඇත.

2023.09.18 දිනැතිව පළමු පාර්ශ්වය තම දෙවන විස්තර ප්‍රකාශනය බේරුම්කරණ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබීය. දෙවන පාර්ශ්වය විසින් ලබාදී තිබු පළමු විස්තර ප්‍රකාශනයෙන් 6 හා 7 ඡේදයන් පිළිගනිමින් ද, අනෙකුත් කරුණු තරයේ ප්‍රතික්ෂේප කරමින් ද, ඒ අනුව ඔහු ඉල්ලා ඇති සහනයන් ලබාදෙන ලෙස ද එම දෙවන විස්තර ප්‍රකාශනයේ සඳහන් කර ඇත. 2023.09.18 දිනැතිව දෙවන පාර්ශ්වයද තම දෙවන විස්තර ප්‍රකාශනය බේරුම්කරණ අධිකරණයට භාර දී තිබේ. පළමු පාර්ශ්වයේ කරුණු ප්‍රතික්ෂේප කර ඇත. විකුණුම් ඉලක්ක සපුරා නොගැනීම, පරිවාස කාලය තුළ සේවය අවසන් කිරීමට පවා අවස්ථාව තිබීම, එසේ නොකොට කාර්ය සාධනය සම්බන්ධයෙන් නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට පළමු පාර්ශ්වයට අවස්ථා සලසා දීම හේතුවෙන් නීතිමය වශයෙන් හා සාධාරණත්වය යන කරුණුවලට අනුව පළමු පාර්ශ්වය ඉල්ලා සිටින සහන සඳහා හිමිකම් නොමැති බව අවධාරණය කෙරේ.

දෙපාර්ශ්වයේ ම ලිඛිත ප්‍රකාශන සලකා බැලීමෙන් අනතුරුව 2023.10.17 දිනට සාක්ෂි විභාගය නිරවුල් කෙරුණි. එදින හා 2023.10.27 දින ද යලි සාක්ෂි කැඳවන ලදී. මෙවැනි R1 සිට R5 දක්වා ලබාදුන් ලේඛනවලට පළමු පාර්ශ්වයේ විරෝධතාවය වාචිකව ප්‍රකාශ කෙරුණි. සාක්ෂි විභාගයෙන් අනතුරුව තවදුරටත් දෙපාර්ශ්වය අතර සාකච්ඡා කොට කිසියම් එකඟතාවයකට පැමිණීමේ හැකියාව සලකා බැලීම වෙනුවෙන් නැවත පරීක්ෂණය 2023.11.21 දිනට කල් තබන ලදී. එදින දෙපාර්ශ්වයම යම් එකඟතාවයකට පත් නොවූ බව බේරුම්කරණ අධිකරණය වෙත ප්‍රකාශ කරන ලදී. එහිදී පළමු පාර්ශ්වය ඇමුණුම් A ද දෙවන පාර්ශ්වය R1 සිට R5 දක්වා ඇමුණුම් ද ඉදිරිපත් කරන ලදී. මේ අනුව පරීක්ෂණ කටයුතු අවසන් විය. මෙම නඩුකරයේ දී දීර්ඝ කාලයක් තුළ දෙපාර්ශ්වයටම ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම සාක්ෂි ලබාදීම මෙන්ම යලිත් සාකච්ඡාමය වශයෙන් කිසියම් එකඟතාවයකට ඒමට අවස්ථාව සලසාදී ඇත. ඒ අනුව ප්‍රකාශනය ලබාදීමේදී බේරුම්කරණ අධිකරණය විසඳිය යුතු ප්‍රශ්න වෙනුවෙන් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී.

යූ.ඒ. ලහිරු රංගන සඳරුවන් හෙවත් පළමු පාර්ශ්වය වෙත 2012 සැප්තැම්බර් මස 24 දිනැතිව ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක පත්වීම ලබාදී ඇත. එම පත්වීමෙහි කොන්දේසි සඳහා පළමු පාර්ශ්වය එකඟ වී ඇත. මෙම පත්වීමෙන් පළමු පාර්ශ්වය විසින් සපුරාගත යුතු ඉලක්ක පැහැදිලි නැති නමුත් 2012.09.21 දිනැති ලිපියෙන් ඉහත තනතුරට අදාළව සපුරාගත යුතු ඉලක්ක පැහැදිලිව දක්වා ඇත.

2012/2013 සඳහා අරමුණු හා සපුරාගත යුතු ඉලක්ක පැහැදිලිව දක්වා ඇත. 2012/2013 සඳහා අරමුණු හා සපුරා ගත යුතු ඉලක්ක පිළිබඳ ලේඛනයට දෙපාර්ශ්වයම අත්සන් තබා ඇත. 2014.12.01 දිනැති නැවත ලබා දුන් අලෙවි විධායක පත්වීම් ලිපියට අනුව පළමු පාර්ශ්වය විසින් සපුරාගත යුතු ඉලක්ක දක්වා ඇත. එම පත්වීම් ලිපියෙහි කොන්දේසි නැත. දෙපාර්ශ්වයම එයට කැමැත්ත ප්‍රකාශ කොට අත්සන් තබා ඇත.

බේරුම්කරණ අධිකරණය විසින් මෙම නඩුව මෙහෙයවන අවස්ථාව වන විට පළමු පාර්ශ්වය සේවය හැර ගියා සේ සලකා දෙවන පාර්ශ්වය කටයුතු කර ඇත. එම සේවය අතහැරයාම පිළිබඳ මහනුවර කම්කරු විනිශ්චය සභාවේ මේ වන විට නඩු කටයුත්තක් පවතී.

පළමු පාර්ශ්වය විසින් තම පැමිණිල්ල තුළින් දෙවන පාර්ශ්වය වෙතින් රු 7,874,400 ක මුදලක් අයවිය යුතු බවත් ඉන් 2015 සිට මේ දක්වා ගෙවා ඇති වැටුප් හා දීමනා අඩු කොට ඉතිරි මුදල ලබාගැනීමට ඉල්ලා සිටී. නමුත් එම ඉල්ලීම දෙවන පාර්ශ්වය විසින් ප්‍රතික්ෂේප කර ඇත.

2012.09.21 දින ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක නිලධාරියෙකු ලෙස MBSL රක්ෂණ සමාගමේ සේවයට බඳවාගෙන ඇති යූ.ඒ. ලහිරු රංගන සඳරුවන් මහතාට සේවයට බැඳුනු අවස්ථාවේ පැවති වැටුප හා සියලු දීමනා හා නිලය සේවා ගිවිසුම අවලංගු කිරීමක් නොකොට නව ගිවිසුමකට එළැඹීමට පෙර 2015 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක නිලධාරියෙකු සඳහා ලබාදෙන වැටුප සියලු දීමනාවන් හා වරප්‍රසාද ලබා නොදීම.

2012.09.21 දින සිට සේවය කළ ද මේවනතෙක් ස්ථිර නොකිරීම පිළිබඳ පැමිණිල්ල පිළිබඳව පහත සඳහන් තීන්දු ප්‍රකාශනය සිදු කරනු ලැබේ.

පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර එකඟ වූ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ඇති බැවින් 2015 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි යූ.ඒ. ලහිරු රංගන සඳරුවන් මහතාට ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක නිලධාරියෙකු ලබා දෙනු ලබන සියලු දීමනා හා වරප්‍රසාද ලබාගැනීම සඳහා සිදුකර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

යූ.ඒ. ලහිරු රංගන සඳරුවන් මහතා මේ වන විට MBSL රක්ෂණ සමාගමේ සේවය අතහැර ගොස් ඇති සේ සලකා ඇති බැවිනුත් එම කරුණට අදාල මහනුවර කම්කරු විනිශ්චය සභාවේ නඩු කටයුත්තක් විභාග වන බැවිනුත් මෙම බේරුම්කරණ අධිකරණය විසින් පළමු පාර්ශ්වය විසින් සේවය ස්ථිර කිරීම සම්බන්ධව සිදුකර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

කෙසේ වුවද, පළමු පාර්ශ්වය රැකියාව අහිමිවීම හුදෙක්ම ඔහුගේම ස්වාධීන තීරණයක් මත පමණක් සිදු නොවූ බවත් ඒ සඳහා දෙවන පාර්ශ්වයෙන් ක්‍රියා කලාපය තුලින් යම් අගතිදායක බලපෑමක් සිදු වූ බවද මෙම බේරුම්කරණය විසින් නිරීක්ෂණය කෙරේ. පැමිණිලිකාර පාර්ශ්වයට තනතුර හා වැටුප පහළ දැමීමට හේතු වූ දෙවන ගිවිසුම ඔහු අත්සන් කර ඇත්තේ ස්වකීය කැමැත්තෙන්ම නොවන බවත්, දෙවන පාර්ශ්වය වෙතින් එල්ල වූ පීඩනය නිසා බව නඩුකරය පුරාම පැහැදිලි විය. 2014.12.01 දිනැති ගිවිසුමට ඔහු අත්සන් තබා ඇත්තේ 2014.12.29 දිනය. එම මාසයෙහි වේතනය දෙසැම්බර් 25 වන දින ගෙවීමේදී අත්සන් නොකල ගිවිසුමක් පාදක කොටගෙන එම වැටුප ගෙවීමෙන්ම ඒ බව පැහැදිලි වේ. තම වරද දෙවන පාර්ශ්වය විසින් පසුව නිවැරදි කර ඇතත් ඔවුන්ගේ අවිධිමත් ක්‍රියාකලාපය පළමු පාර්ශ්වය දුෂ්කරතා රැසකට මුහුණ පෑමට හේතු වී ඇති බවද වැඩිදුරටත් නිරීක්ෂණය වේ. දෙවන පාර්ශ්වයේ අවිධිමත් ක්‍රියාකලාපය හේතුවෙන් පළමු පාර්ශ්වයට රැකියාව කරගෙන යාමට සිදු වූ අපහසුතාවය හා මානසික පීඩනය සැලකිල්ලට ගෙන එම තත්වය සලකා බලා පළමු පාර්ශ්වය වන යූ.ඒ. රංගන සඳරුවන් මහතාට රු ලක්ෂ 05 (රු 500000) එකවර ගෙවන වන්දි මුදලක් ගෙවිය යුතු බවට දෙවන පාර්ශ්වය වන MBSL රක්ෂණ සමාගම වෙත නියෝග කරමි. එම මුදල මෙම ප්‍රදානය ගැසට් ගත වී මසක් ඇතුළත මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් කාර්යාලය වෙත තැන්පත් කල යුතුය.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සඳහන් කරමි. ව්‍යවස්ථාපිත හිමිකම් අයදුම්පත් මෙම ප්‍රදානය බාධාවක් නොවේ.

ආචාර්ය කේ.ඒ. තිලකරත්න
(බේරුම්කරු).

2023 දෙසැම්බර් මස 20 වන දින

EOG 05 - 0194

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.